මගේ අංකය – අනු 2/4/1/5/6-1
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කැබිතිගොල්ලෑව.

23 OCT 2018

**වාහල්කඩ මහා වාරිමාර්ග 2018/2019 මහ කන්න රැස්වීම් වාර්තාව**

පැවැත් වූ දිනය -2018.10.03
වේලාව -ප .ව 2.00
ස්ථානය -පෙර පාසල් ගොඩනැගිල්ල,වාහල්කඩ ඩී -04
මුලාසනය -ආර් .එන්. වන්නිනායක මහතා දිස්ත්‍රික් ලේකම් / දිසාපති, අනුරාධපුර

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | ආර් .එන්. වන්නිනායක මයා | දිස්ත්‍රික් ලේකම් |
| 02 | ටී.වී.කේ.රත්නායක මයා | ප්‍රාදේශීය ලේකම් , කැබිතිගොල්ලෑව |
| 03 | ආර් සෙන්දිල් මයා | සහකාර ප්‍රාදේශීයලේකම්,හොරොව්පතාන |
| 04 | ඇම්.ඩබ්.පී.ද. සිල්වා මයා | වාරි මාර්ග අධ්‍යක්ෂ , අනුරාධපුර |
| 05 | ජී.එස්.කේ.සමරවීර මිය | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ(අන්තර පළාත්) |
| 06 | එම්.එච්.එම්.හම්ෂීන් මයා | ඉංජිනේරු ,පදවිය |
| 07 | ටී.බී.එම්.එල්.එස්.කුමාර මයා | ඉංජිනේරු සහකාර , පදවිය |
| 08 | ආර්.එම්.ඕ.එන්.ජයවර්ධන මයා | වාරිමාර්ග ඉංජිනේරු, |
| 09 | එච්.පී.ජයනාත් මයා | ප්‍රධාන ඉංජිනේරු, ජලසම්පාදන මණ්ඩලය ,අනුරාධපුර |
| 10 | කේ ඩබ්.ටී.මලින්ද මයා | ඉංජිනේරු සහකාර ,යාන්ඔයව්‍යාපාරය |
| 11 | එන් .අයි.වික්‍රම සිංහ මයා | ජලසම්පාදන මණ්ඩලය , අනුරාධපුර |
| 12 | එම්.එල්.ජේ.විජේරත්න මයා | කොට්ඨාශ සහකාර යාන්ඔය ව්‍යාපාරය වම් ඉවුර |
| 13 | එන්. වසන්ත මයා | නේවාසික ව්‍යාපාර කළමණාකරු |
| 14 | ඊ.එම්.ඒ. විජේබංඩාර මයා | කෘෂි කර්ම ගොවිජන රක්ෂණ මණ්ඩලය, |
| 15 | ජේ.ආර්.එස්.ජේ.වනසිංහ මිය | කෘෂි රක්ෂණ නිලධාරි |
| 16 | එස්.ජී.කේ.ප්‍රභාත් ගුණපාලමයා | ගොවිජන සේවාප්‍රාදේශිය නිලධාරි ,කැබිතිගොල්ලෑව |
| 17 | ජී.කුමාරසිංහ මයා | සංවර්ධන නිලධාරි (කෘෂිකර්ම) කැබිතිගොල්ලෑව |
| 18 | එච්.රණසිංහ මයා | ඉඩම් නිලධාරි ,යාන්ඔය ව්‍යාපාරය |
| 19 | ආර් පී.ජී.ආර්.කේ.මනුවීර මයා | කෘෂි උපදේශක |
| 20 | එම්.ජී.ගාමිණී විජය මයා | ජනපද නිලධාරි ,වාහල්කඩ |
| 21 | ඊ.එම්.ජී.විජයබංඩාර මිය | ක්ෂේත්‍ර නිළධාරි කෘෂි රක්ෂණ මණ්ඩලය |
| 22 | ජී.උපාලි දිසානායක මයා | ග්‍රාම නිලධාරි ,39 තුලාන, වාහල්කඩ |
| 23 | එස්.ජී.එස්.රත්නායක මයා | ග්‍රාම නිලධාරි ,41 තුලාන,වාහල්කඩ |
| 24 | එච්.එන්.ධනුෂ්ක උදයංග මයා | තාක්ෂණ සහාකාර (වාරිමාර්ග) |

| | | |
|---|---|---|
| 25 | එස්.එන්.බංඩා මයා | කෘ.ප.නි.සහකාර |
| 26 | බී.එස්.එස්.කේ.සේනාරත්න මයා | කෘ.ප.නි.සහකාර |
| 27 | එන් .දිසානායක මයා | කෘ.ප.නි.සහකාර |
| 28 | එස්.එම්.ඩී.එන්.සෙනවිරත්නමයා | කෘෂි උපදේශක |
| 29 | ,එන්.රත්නායක මයා | පොලිස් සැරයන් (වාහල්කඩ) |
| 30 | ඩී.ධනවර්ධන මයා | රාජ්‍ය කලමණා කරන සහකාර (කැබිතිගොල්ලෑව) |
| 31 | කේ.එම්.සී.ඩී.කුමාරසිංහ මයා | රාජ්‍ය කලමණා කරන සහකාර(හොරොව්පතාන) |
| 32 | ඊ.එම්.රවින්ද්‍ර ඒකනායක මයා | රාජ්‍ය කලමණා කරන සහකාර (දි.ලේ.කා.) |

පැමිණි සිටි ගොවි මහත්ම මහත්මීන් ගණන = 23

නේවාසික ව්‍යාපාර කළමනාකරු එන් .වසන්ත මහතා විසින් පැමිණි සිටි දිස්ත්‍රික් ලේකම්, රාජ්‍ය නිලධාරින් ,රාජ්‍ය නොවන සංවිධාන සාමාජිකයන් හා ගොවි සංවිධානවල නිලධාරින් හා ගොවි මහත්ම මහත්මීන් පිළිගැනීමෙන් අනතුරුව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම්ආර් .එන්.වන්නිනායක මහතා වෙත මුලසුන භාර දෙන ලදී.

අනතුරුව දිස්ත්‍රික් ලේකම්තුමා විසින් මුලසුන භාර ගනිමින් වාහල්කඩ ව්‍යාපාර පිළිබඳ ව හා අද පැවැත්වෙන කන්න රැස්වීමේ වැදගත්කම මෙන්ම අරමුණු පැහැදිලි කරමින් කම්ටුවේ වැඩ කටයුතු මෙහෙය වන්නට විය . වසර කිහිපයක නියං කාලක් පැවති අතර ඉදිරියේදී වැසි ලැබේ යැයි විශ්වාසයෙන් යුතුව මෙම කන්න රැස්වීම පවත්වන බව පැවසිය

<u>ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු පදවිය එම්. එච්.එම්.හමීශීන් මහතා</u>

මේ වන විට ජලාශයේ ජල ධාරිතාව අක්කරඅඩි 1066 ධාරිතාවයක් පවතින බවත් ,ඒ අනුව සම්පූර්ණ ව්‍යාපාර බල ප්‍රදේශයම වගා කටයුතු කිරිමට නොහැකි තත්වයක් පවතින අතර ඉදිරියේදි වැසි ලැබේ යැයි අපේක්ෂාවෙන් ව්‍යාපාර බල ප්‍රදේශයම වගා කටයුතු සඳහා යොමු විය හැකි බව පැවසිය . තවද පසුගිය වර්ෂ තුල වැවේ පිහිටන ජල ත්ත්වය පිළිබඳවද ගොවින් දැනුවත් කලේය.

<u>වාරිමාර්ග අධ්‍යක්ෂ අනුරාධපුර - එම්.ඩබ්.පී.ඩී.සිල්වාමයා</u>

පසුගිය කන්න වල දත්ත පදනම් කර ගෙන කන්නය ආරම්භ කරන ලෙසත් හොඳ ජල කළමණාකරණයකින් වගා කටයුතු සිදු කළ යුතු බව පැවසිය. කන්නය ආරම්භක අවස්ථාව වන අතර ඉදිරි කාළයේ දි වැසි ලැබිමට ද ඉඩ ඇති බව වැඩිදුරටත් පැවසු අතර ජල ධාරිතාවය අක්කර අඩි 1066 පවතින හෙයින් ජලය නිකුත් කල නොහැකි ත්ත්වයක් පවත්න අතර එය පදනම් කරගෙන තීන්දු තිරණ ගන්නා ලෙස පැවසිය.

<u>කෘෂිකර්ම උපදේශක අන්තර් පළාත් පීඑස්.කේ.සමරවීර මිය.</u>

ඉදිරියේදි වැසි ලැබේ යැයි අපේක්ෂාවෙන් පවත්වන කන්න රැස්වීමක් බවත්,ගොවින් මෙම අවදානම ඇතිව ගොවිතැන් කටයුතු කළ යුතු බව පැවසු අතර බිත්තර වී අවශ්‍යතාවය කොට්ඨාශයේ කෘෂි උපදේශක හරහා ඉල්ලීම් කර හැකි බව පැවසිය.

<u>ගොවිජන සේවා මධ්‍යාස්ථානය කැබිතිගොල්ලෑව - එස්.ඒ.කේ. ප්‍රභාත් ගුණපාල මයා</u>

1.මෙම කන්නයේ පොහොර සහනාධාරය ලබා දිමට අවශ්‍ය සියලු කටයුතු සංවිධානය කර ඇති බව පැවසිය.

<u>නේවාසික ව්‍යාපාර කළමනාකරු (වහල්කඩ ව්‍යාපාරය) - එන්. වසන්ත මයා</u>

ජල ධාරිතාවය පිළිබඳ සැලකිලිමත් වෙමින් කන්නය සාර්ථකව ඉදිරියට කර ගෙන යාමට සියලු දෙනාම සහයෝගයෙන් කටයුතු කළ යුතු බව පැවසිය.

කෘෂි රක්ෂණ මණ්ඩලය-ජේ.ආර් එස්.කේ වනසිංහ මයා
කන්න රැස්වීම් තින්දු තිරණ වලට අනුව කෘෂි රක්ෂණ මුදල් ලගවීම කරන බවත්, පොහාර සහනාධාරය යටතේ වීවගාව අක්කර 05 හා අතිරේක බෝග වගාව අක්කර 21/2 ට නොමිලේ රක්ෂණාවරණයක් ලැබෙන බව පැවසිය.

වෙනත් කරුණු

1.යාන් ඔය ව්‍යාපෘතිය යටතේ මාර්ග සතර නිසි ලෙස සකස් නොකල හොත් ව්‍යාපාරය දෙකඩ විය හැකි බව ගොවින් නියොජිතයෙකු පැවසු අතර , ඒ සම්බන්ධයෙන් යාන් ඔය ව්‍යාපාරයෙන් නියොජිත පැවසුවේ වම් ඉවුර පාර හැර අනෙක් මාර්ග ලබා දිය හැකි බවය

2. හානි වී ඇති කෙත් ඇළ වල් හා බෝක්කු අලුතින් සකස් කර දිය හැකි බව යාන්ඔය ව්‍යාපාරයෙන් පැමිණි නියොජිතයා පැවසිය.

3.යාන් ඔය වම් ඉවුර හැකි ඉක්මනින් සකස් කර දෙන ලෙසත් ,ව්‍යාපාරය නිසා වගා කළ නොහැකි කන්න සඳහා අදාල වන ඉඩම් වලට වන්දි ලබා දිම සිදු කල යුතු බවත්, මේ පිළිබඳව යාන් ඔය ව්‍යාපෘති අධ්‍යක්ෂ හා වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු බව දිස්ත්‍රික් ලේකම් පැවසිය

4.ව්‍යාපෘතිය නිසා වැවට ජලය එන පෝෂිත ඇල වැසි ඇති බව ගොවි නියෝජිත මහතෙකු පැවසු අතර එය කඩිනමින් සකස් කර දෙන ලෙස දිස්ත්‍රික් ලේකම් පැවසිය

5.මහා සියබලා කුලම වැවේ ජල ධාරිතාවය වම් ඉවුර සකස් කිරිමේ දි වැසි ඇති අතර එය කඩිනමින් සකස් කර දෙන ලෙස ව්‍යාපෘති අධ්‍යක්ෂක වෙත දිස්ත්‍රික් ලේකම් පැවසිය

6. පානිය ජල ව්‍යාපෘතිය යාන් ඔය ව්‍යාපෘතිය සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කිරිමට නියමිත වන අතර ජල පිරිසිදු කිරිමේ ජල පොම්පාගාරය යාන්ඔය ව්‍යාපෘතිය ආසන්නයේ සකස් කිරිම සඳහා යොදා ගන්නා ලෙස දිස්ත්‍රික් ලේකම් පැවසිය

7. කන්න රැස්විමේ ගන්නා ලද තින්දු තිරණ සංශෝධනය කිරිමේදි දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු වෙත යොමු කළ යුතු බව පැවසිය.

පෙර කන්න තිරණ සංශෝධනය කිරිම
පෙර කන්නයේ දි තිරණය කරන ලද සෑම දිනයක්ම එලෙසම පවතින අතර වගා හානි දැනුන් දිමේ අවසන් දිනය 2019.02.25 විය යුතු බව සංශෝධනය කළේය.

2018/2019 මහ කන්න රැස්වීම් තීරණ – වාහල්කඩ ව්‍යාපාර

| | |
|---|---|
| 01.වගා කිරිමට අපේක්ෂිත බෝග වර්ගය | - වී මාස 3 , 3 ½,අතිර්ක බෝග |
| 02.වගා කිරිමට යෝජිත බිම් ප්‍රමාණය | - අක්කර 2100 |
| 03.වගා කිරිමට යෝජිත ප්‍රදේශය | -සම්පූර්ණ ව්‍යාපාර බල ප්‍රදේශය |
| 04.ගොවින් ඇල වෙළි නඩත්තු කරන අවසන්කළයුතු දිනය | -2018.10.15 |
| 05.ගොවින් විසින් නියමිත වෙළාවට නඩත්තු නොකරණ ඇළවල් සහ බෙදුම් ඇළවල් දියබස්නා ඇළවල්නඩත්තු කළයුතු දිනය | -2018.10.20 |
| 06.ගො.සං.හා වා.දෙ.විසින් ප්‍රධාන ඇළ සහ බෙදුම් ඇළවල් දියබස්නා ඇළවල් නඩත්තු කර අවසන් කලයුතු දිනය | -2018.11.01 |
| 07.මුල් වරට ජලය නිකුත් කිරිමට යෝජිත දිනය - ව්‍යාපාර කමිටුවේ තිරණය මත | |

කමිටුවේ තීරණය මත
08.බිම් සැකසීම ආරම්භ කළ යුතු දිනය -2018.10.20
09.වැපිරීම හා පැල සිටුවීම අවසන්කළ යුතු දිනය -2018.11.20
10.මුර ජලය ආරම්භක දිනය - ව්‍යාපාර කමිටුවේ තීරණය මත
11.අවසන් වරට ජලය නිකුත් කිරීමට යොජිත දිනය -2019.03.01
11.ට්‍රැක්ටර් හා ගවයන්යායෙන් ඉවත් කළ යුතු දිනය -2018.11.20
12.වගාව රක්ෂණය කර අවසන් කළ යුතු දිනය -2018.11.20
13.වගා හානි දැනුම් දීමේ අවසන් දිනය -2019.02.25
14.අස්වනු නෙළා අවසන් කල යුතු දිනය -2019.03.20

<u>වෙනත් යෝජනා</u>

- නිර්මිත හානි දඩය වාරිමාර් දෙපාර්මෙන්තුව තක්සේරුව අනුව
- ඇළ වෙළි ශුද්ධ නොකිරීමේ දඩය : බඹ එකක් සඳහා රු.200ත්
- සංවර්ධන අරමුදල :අක්කරයක් සඳහා රු.200

යෝජනා කළේ :- පී.නවරත්න මහතා
ස්ථිර කළේ :- එස්.ප්‍රේමලතා මිය

රාජ්‍ය නිළධාරීන් රාජ්‍ය නොවන සංවිධාන සාමාජිකයන් හා ගොවි සංවිධානවල නිලධාරීන් හා ගොවි මහත්ම මහත්මීන් ඇතුළු සියලුම දෙනා වෙත ස්තුතිය පුද කල අතර,අවදානම් කැප කිරීම් වලින් ජය ගත හැකි සාර්ථක මහා කන්නයක් ප්‍රාර්ථනා කරමින් , සියලුම දෙනා වෙත ස්තුතිය පුද කල අතර කමිටුවේ වැඩ කටයුතු අවසන් කරන්නට යෙදුනි.

.....................
ප්‍රාදේශිය ලෙ
කැබිතිගොල්

පී.වී.කේ.රත්නායක
ප්‍රාදේශීය ලේකම්
කැබිතිගොල්ලෑව

පිටපත් :-

01.දිස්ත්‍රි ... දිසාපති ,අනුරාධපුර – කා.දැ.පි.
02.ප්‍රාදේශිය ලේකම් ,හොරොව්පතාන – කා.දැ.පි.
03.ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස් ,අනුරාධපුර – කා.දැ.පි.
04.නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් ,අනුරාධපුර – කා.දැ.පි.
05.නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂක,අනුරාධපුර – කා.දැ.පි
✓06.අධ්‍යක්ෂක ,වාරිමාර්ග හා ජල කළමනාකරණ අංශය,කොළඹ – කා.දැ.පි.
07.කළාප වාරිමාර්ග අධ්‍යක්ෂක අනුරාධපුර – කා.දැ.පි.
08.ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු,පදවිය – කා.දැ.පි.
09.නේවාසික ව්‍යාපාර කළමනාකරු,වාහල්කඩ – කා.දැ.පි.
10.සහකාර අධ්‍යක්ෂක,පොහොර ලේකම් කාර්යාලය , අනුරාධපුර – කා.දැ.පි.
11.කළමනාකරු,කෘෂිරක්ෂණ මණ්ඩලය,අනුරාධපුර – කා.දැ.පි.
12.ගොවිජන සේවා ප්‍රාදේශිය නිළධාරි,කැබිතිගොල්ලෑව/කපුගොල්ලෑව – කා.දැ.පි.